**සහල් ආනයනය කිරීමේදී මිනිස් පරිභෝජනයට සුදුසු බවට සහතික ලබා ගැනීම. (Health Certificate and Phytosanitary Certificate)**

මෑත කාලයේ පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය හා අන්තර් ජාලය තුල දැඩි ලෙස කතාබහට ලක්වූ ප්ලාස්ටික් සහල් සම්බන්ධ ගැටළුව 2017-07-11 දින පැවැති ආහාර උපදේශක කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වූ අතර එහිදී එළඹ ගත් තීරණ පරිදි, සහල් ආනයන කරුවන් සහල් ආනයනය කිරීමේදී පහත උපදෙස් පිළිපැදිය යුතුය.

1. 2017-08-10 දින සිට ශ්‍රී ලංකාවට සහල් ආනයනය කිරීමේදී එම සහල් මිනිස් පරිභෝජනයට සුදුසු තත්ත්වයේ පවතින බවට අදාල සහල් අපනයනය කරනු ලබන රටේ ආහාර පාලනය සම්බන්ධ අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකය (Health Certificate) ඉදිරිපත් කළ යුතුය.
2. ශාක නිරෝධායනය පිළිබඳ සහල් අපනයනය කරනු ලබන රටේ අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකය (Phytosanitary Certificate) ඉදිරිපත් කළ යුතුය.